# කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිළධාරීන් වගකීම් ඉටුකිරීමේදී දේශපාලන බලතල බෙදාහැරීමේ බලපෑම

අයි.එච්.අයි.එම්. බණ්ඩාර[1] එම්.කේ. නදීකා දමයන්ති[2]

**සංක්ෂේපය**

විමධ්‍යගතකරණය ලෝකයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක්ම වර්තමානයේ පිළිගත් සංකල්පයකි. ශ්‍රී ලංකාවේ ද විමධ්‍යගතකරණ මාදිලියක් වන දේශපාලන බලතල බෙදාහැරීම යටතේ 1987දී පළාත් සභා පිහිටුවන ලදී. ඒ අනුව එතෙක් මධ්‍යම ආණ්ඩුව යටතේ පැවති බලතලවලින් කිසියම් ප්‍රමාණයක් පළාත්සභා සඳහා ලබාදෙන ලදී. ගොවිජනසේවා විෂයය ද එසේ පැවරූ විෂයකි. කෘෂිකාර්මික හා ගොවිජනසේවා ක්ෂේත්‍රයේ පළාත් මෙන් ම මධ්‍යයේ වගකීම් ද බිම්මට්ටමේදී ඉටුකිරීමට පැවරී ඇති නිළධාරියා වන්නේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරය. නමුත් ඔවුන්ගේ වගකීම බැදී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව සමගිනි. ඒ අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට මධ්‍යම ආණ්ඩුව හා පළාත්සභා සම්බන්ධයෙන් පැවරී ඇති රාජකාරි ඉටුකිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටලු අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණක් වේ. මේ සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් තුළින් ප්‍රාථමික දත්තත් ලිපි, ග්‍රන්ථ ආදිය මගින් ද්විතීක දත්තත් ලබා ගන්නා ලදී. අධ්‍යයන ප්‍රදේශ ලෙෂ කෑගල්ල දිස්ත්‍රික්කය අහඹු ලෙස ගන්නා ලදී. එහිදී දිස්ත්‍රික්කය තුළ විසිරී යන පරිදි කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරනිළධාරීන් 100ද, ගොවීන් 100ද අහඹු ලෙෂ තෝරා ගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් වැඩි ප්‍රමාණයකට එනම් 20% කට පමණ ප්‍රධාන ගැටලුව වී ඇත්තේ රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති වීමයි. එමෙන්ම අධ්‍යයනයට සහභාගි වූ නිළධාරීන්ගෙන් 10%ට කාර්යාල දීමනා හා වැඩබලන දීමනා ලබා නොදීම, 12%ට ගොවි ආරවුල් වැඩි වශයෙන් පැවතීම නිළධාරීන් වැඩිපිරිසක් රාජකාරි ඉටුකිරීමේදී මුහුණදෙන ගැටලු වේ. එමෙන්ම ඔවුන්ට පැන නගින නීතිමය ගැටලු ලෙස ප්‍රධාන වශයෙන්ම 2000 අංක 46 දරණ 19%ට ගොවිජනසේවා පනතට අනුව කටයුතු කිරීමට අපහසුවීමත්, 10%ට කුඹුරු ඉඩම්වල අනවසර ඉදිකිරීම් හා කුඹුරු ඉඩම් ගොඩකිරීමත් ඒවා සම්බන්ධව රාජකාරි කිරීමේදී දේශපාලනයේ මෙන්ම ආයතනයේ ඉහළ නිළධාරීන්ගේ බලපෑමත් දැක්විය හැකිය. එමෙන්ම කෘෂිකාර්මික කටයුතු කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටලු සඳහා ඉක්මන් විසඳුම් ලබාදීමට හැකියාවක් නොවීම, කෘෂිකාර්මික කටයුතුවලින් ක්‍රමක්‍රමයෙන් ජනතාව ඈත්වීම ආදී ගැටලු මෙන්ම කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරු කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආයතන සඳහා සේවය කළයුතු වීමත් එසේ සේවය කළත් ඔවුන්ට ඒ සඳහා වෙනත් දීමනාවක් ලබා නොදේ. එමෙන්ම බොහෝ විට

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk

එම රාජකාරිවල අවසාන වගකීම දැරීමට සිදුවන්නේද කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරටය. එමෙන්ම ඔවුන් ග්‍රාම නිළධාරී වසම් දෙකක සේවය කළත් එය එක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසමක් ලෙස ගණන් ගැනීම නිසා ඔවුන්ට රාජකාරි ඉටුකිරීම සඳහා පවතින ප්‍රදේශය පුළුල් වේ. නමුත් මොවුන් ගොවිජනසේවා දෙපාර්තමේන්තුවට තොරතුරු සැපයිය යුතු වන්නේ ග්‍රාම නිළධාරී වසම් මට්ටමිනි.

**මුඛ්‍ය පද :** *කෘෂිකර්මය, විමධ්‍යගතකරණය, ගොවිජන සේවා, පළාත් සභා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර*